# බුද්ධිමය දේපළ වලින් සපිරි ඔබේ ලෝකය








NATIONAL SCIENCE FOUNDATION

ජාතික විද්‍යා පදනම



සිතන්න,
සිතින් මවන්න,
නිර්මාණය කරන්න!

# බුද්ධිමය දේපළ වලින් සපිරි ඔබේ ලෝකය

ප්‍රථම මුද්‍රණය - 2019
ISBN 978-955-590-135-2

© සියලු හිමිකම් ඇවිරිණි

ප්‍රකාශනගේ ලිඛිත අවසරයකින් තොරව මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් කුමන ආකාරයකින් හෝ කුමන ක්‍රමයකින් හෝ ඉලෙක්ට්‍රොනිකව, යාන්ත්‍රිකව, ඡායාපිටපත් මගින් සම්ප්‍රේෂණය සහ භාවිතය, කිසියම් පද්ධතියක සටහන් කිරීම හා ගබඩා කර තැබීම සපුරා තහනම්ය.

සම්පාදනය, කවර නිර්මාණය, පරිගණක සැකසුම, මුද්‍රණය, ප්‍රකාශනය } ජාතික විද්‍යා පදනම

# පටුන


හැඳින්වීම ........................................ 01

ප්‍රකාශන අයිතිය ........................................ 02

රංගන ශිල්පීන්ගේ සහ විකාශනයන්ගේ අයිතිය .................. 04

'පේටන්ට්' බලපත්‍ර ........................................ 05

කාර්මික සැලසුම් ........................................ 06

වෙළඳ ලකුණු ........................................ 07


භූගෝලීය දර්ශක ........................................ 12

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය .................................. 14

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය .................... 15

# හැඳින්වීම

බුද්ධිමය දේපළ නිරන්තරුවම ඔබේ ජීවිතය හා බැඳී පවතින බව ඔබ මදකට හෝ සිතුවාද? ඔබේ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවල ඔබ කරන සෑම ක්‍රියාකාරකමකදීම බුද්ධිමය දේපළ ඔබ හා සමග අත්වැල් බැඳ සිටියි. ඔබ අඳින පළඳින ඇඳුම් පැළඳුම්, ඔබ භාවිතා කරන ඔබේ අත්බෑගය හෝ පාසල් බෑගය, එහි රැගෙන යන පොත්පත් හෝ වෙනත් උපකරණ එමෙන්ම ඔබ සවන්දෙන සංගීතය, ඔබ නරඹන නාට්‍ය බුද්ධිමය දේපළ වශයෙන් ඔබ බොහෝ දෙනා මෙතෙක් වටහාගෙන නොමැතිව සිටියා විය හැකියි.




## බුද්ධිමය දේපළ යනු මොනවාද ?

මිනිස් මනස තුල ඉපදී බිහිවන විවිධ ගණයේ නිර්මාණ සහ නව නිපැයුම් බුද්ධිමය දේපළ ලෙස හැඳින්වේ. හිමිදිරියේ පටන් සැඳෑයාමය තෙක්ද, අප පාසලේ හෝ රැකියාව කරන ස්ථානයේ හෝ වෙන යම් ස්ථානයක ගත කරන කාලය තුලදී ද, අප අපේ මිතුරන් සමග ගැවසෙන කාලයේ සිට නින්දට යනතෙක්ද, සෑම දිනකම සෑම තැනකම බුද්ධිමය දේපළ අපේ ජීවිත හා රැඳී පවතී.

බුද්ධිමය දේපළ ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක. ඉන් පළමුවැන්න කාර්මික දේපළ වශයෙන් හැඳින්වෙන අතර, නව නිපැයුම් හෙවත් **“Patents”**, වෙළඳ ලකුණු, කාර්මික සැලසුම් සහ භූගෝලීය දර්ශක එයට ඇතුලත් වේ. දෙවැන්න වනුයේ ප්‍රකාශන අයිතීන්ය. ඒ අතරට ලිඛිත, රඟදැක්වූ හෝ පටිගත කරන ලද කලා නිර්මාණ සහ පුළුල් පරාසයක පැතිරුණු සාහිත්‍ය නිර්මාණ ඇතුලත් වේ.

*බුද්ධිමය දේපළ වලින් සපිරි ඔබේම ලෝකයට කරන ආරාධනයයි මේ.......*

# ප්‍රකාශන අයිතිය

ප්‍රකාශන අයිතිය යනු පුළුල් පරාසයක පවතින සාහිත්‍යමය සහ කලාත්මක නිර්මාණ සඳහා එම නිර්මාණකරුවන්ට හිමිවන නීත්‍යානුකූල අයිතියකි. මෙම අයිතිය තුලින් නිර්මාණකරුවන්ට තම නිර්මාණ භාවිතා කිරීමට හෝ යම් ආකාරයකින් අන් අයට භාවිතා කිරීම සඳහා බලය පැවරීමට හෝ හිමිකම් ලැබෙන අතර එම නිර්මාණ මගින් මුදල් ඉපයීමටද හැකියාව ලැබේ. තවද නිර්මාණකරුවාට තම නිර්මාණය සඳහා හොඳ ආර්ථික ප්‍රතිලාභද, මෙම අයිතිය තුලින් ලබා ගත හැකි වේ. ඊට අමතරව ප්‍රකාශන අයිතීන් ලබා ගැනීම මගින් කලාකරුවන්ටත්, නිෂ්පාදකයින්ටත්, ගුවන්විදුලි ප්‍රචාරක ආයතන හෝ සංවිධානවලටත්, අදාල නිර්මාණ සඳහා ආරක්ෂාවද සැපයේ.




යම් නිර්මාණයක් සඳහා ප්‍රකාශන අයිතිය ශ්‍රී ලංකාවේ නීතියට අනුව, නිර්මාණකරුවාගේ මුළු ජීවිත කාලය සඳහාම තහවුරු වන අතර, ඔහුගේ හෝ ඇයගේ මරණින් පසුවද වසර 70 ක කාලයක් දක්වා එම අයිතිය ඔහු/ඇය වෙත හිමිවේ. මෙම හිමිකම් කාලය අවසානවීමත් සමගම, අදාල නිර්මාණය මහජනයා හට නොමිලේ භාවිතා කිරිමට හා ප්‍රතිනිෂ්පාදනය කිරිමට හැකියාව ලැබුණද, මුල් කාර්යයේ කතෘත්වයත්, ප්‍රසංශනීයත්වයත් සදාකාලිකව හිමිවනුයේ එහි නිර්මාණකරුවාටය.

ප්‍රකාශන අයිතිය ලබා ගත් හිමිකරුවන් සතු ප්‍රධානතම බියවනුයේ ඔවුන්ගේ රචනා හෝ එහි ඇතුලත් අදහස් වෙනත් පුද්ගලයන් විසින් අනවසරයෙන් උපුටා දැක්වීම හෝ සොරාගැනීම මගින් ඔවුන් සතු හිමිකම් උල්ලංඝණය වීමයි. අන්තර්ජාලය හරහා කෙරෙන ප්‍රකාශන අයිතීන් උල්ලංඝණය කිරිම් මෑතක සිට පැවතී එන තවත් මත භේදාත්මක කරුණකි. බොහෝවිට ප්‍රකාශන අයිතිය සතු හිමිකරුවන් වෙත තම කාර්යයන් පිටපත් කිරිම වෙනුවෙන් වන්දි ගෙවීමක් සිදු වී නැති වුවද, ඒ සඳහා වන්දි ලබා ගත් විවිධ අවස්ථාද බොහෝ ඇත.

# ප්‍රකාශන අයිතිය වඩා පැහැදිලි කිරීම සඳහා උදාහරණ කිහිපයක් පහත ඉදිරිපත් කර ඇත.

ඔබ එදිනෙදා කියවන පත, පොත ඔබ භාවිතා කරන මෘදුකාංග නැතහොත් **Software** සංයුක්ත තැටි නැතහොත් **CD** හා ගීත නිබන්ධන යන සියළුම දෑ ප්‍රකාශන අයිතිය සඳහා උදාහරණ වේ.




සෑම සංයුක්ත තැටියකම ඇති පටිගත කළ ගීත මෙන්ම සංයුක්ත තැටිය මත කළ කලාත්මක නිර්මාණ යන දෙකම ප්‍රකාශන අයිතීන් මඟින් ආරක්ෂා කළ හැක.

පොතපතෙහි ලියා ඇති කරුණු මෙන්ම, පොත් කවරයේ සහ එහි පිටු මත කළ චිත්‍ර ඡායාරූප ආදී කලාත්මක වැඩ සියල්ලද ප්‍රකාශන අයිතීන් මඟින් ආරක්ෂා වේ.



# රංගන ශිල්පීන්ගේ සහ විකාශනයන්ගේ අයිතිය

ගායකයින්, වාදන ශිල්පීන් සහ ශාස්ත්‍රීය හෝ කලාත්මක කෘති හෝ ජනප්‍රවාද ප්‍රකාශනය කරන, ගායනා කරන, ඉදිරිපත් කරන, කථනය කරන, නිරූපණය කරන හෝ අන්‍යාකාරයකින් රඟ දක්වන තැනැත්තන්ගේ අයිතීන් මේ යටතේ හඳුන්වා දෙයි. මේ අනුව, මහජනයා වෙත යම් කෘතියක්, රැඟුමක් හෝ පටිගත කිරීමක් හෝ තැටිගත කළ හඬක් චන්ද්‍රිකා ඔස්සේ සම්ප්‍රේෂණය කිරීම ඇතුළුව, කම්බි විරහිතව සම්ප්‍රේෂණය කිරීම මඟින් සන්නිවේදනය කිරීම මේ යටතේ ආරක්ෂා වේ.







# පේටන්ට් බලපත්‍ර

මුලින් අපි බුද්ධිමය දේපළ කොටස් දෙකකට බෙදෙන බව ප්‍රකාශ කළෙමු. ඉන් එක් කොටසක් ඉහත සඳහන් කළ ප්‍රකාශන අයිතීන් වන අතර, අනික කාර්මික දේපළ ලෙස ඔබට හඳුන්වා දුනිමු.

ඔබ විසින් කෙරෙන නව නිපැයුමක් සඳහා පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කෙරෙන අතර, මෙය කාර්මික දේපළ යටතේ ගැනෙන එක් දේපළ වර්ගයක් එනම් **"Patents"** වශයෙන් හැඳින්වේ.




පේටන්ට් බලපත්‍රය මඟින් නව නිපැයුම සඳහා ආරක්ෂාව මෙන්ම බලපත්‍ර හිමිකරුවාට ඒ සඳහා තනි අයිතියද පැවරේ. මින් අදහස් කෙරෙනුයේ බලපත්‍ර හිමිකරුවාගේ අවසරය නොමැතිව එම නව නිපැයුම නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හෝ විකිණීම කළ නොහැකි බවයි. ශ්‍රී ලංකාවේ නීතියට අනුව මෙම අයිතිය අයදුම් කළ දිනයේ සිට වසර 20 ක් දක්වා නව නිපැයුම්කරුට හිමිවන අතර, ඉන් අනතුරුව ඔහුට ඒ සඳහා ඇති හිමිකම අහෝසි වේ. එවිට එම නිපැයුම මහජනතාව සඳහා විවෘතව පවතින අතර, එය ව්‍යාපාරික වශයෙන් නිෂ්පාදනය කර ලාභ ඉපයීමට ඕනෑම පුද්ගලයෙකුට හැකි වේ.

ආරක්ෂාවට අමතරව පේටන්ට් බලපත්‍රයකට හිමිකම්පෑම නිර්මාණකරුවා දිරි ගැන්වීමක් මෙන්ම ඔහු වෙත ගෙනෙන හොඳ පිළිගැනීමක් ද වේ. එමෙන්ම, ඔහු වෙත ලැබෙන ද්‍රව්‍යමය ප්‍රතිලාභ ද පේටන්ට් බලපත්‍රයක් මඟින් සහතික කෙරේ. පේටන්ට් බලපත්‍ර ලෝකය සතු තාක්ෂණික දැනුම තව තවත් වැඩි කරයි. පේටන්ට් බලපත්‍ර හිමිකරුවන් තම අභිනව නිපැයුම් පිළිබඳ තොරතුරු මහජනයා වෙත හෙළිදරව් කිරීමට බැඳී සිටින අතර, එම තොරතුරු අනෙකුත් නිෂ්පාදකයින් සඳහා වටිනා සම්පත් වනවාසේම විද්‍යාඥයන්ට, පර්යේෂකයන්ට සහ නිෂ්පාදකයන්ට තම සිත් තුළ අළුත් අදහස් හා නිර්මාණ ඇති කිරීම සඳහාද දායක වේ.

# කාර්මික සැලසුම්

කාර්මික දේපළ යටතේ ගැනෙන තවත් බුද්ධිමය දේපළ වර්ගයක් ලෙස කාර්මික සැලසුම් නැතහොත් **“Industrial Designs”** හැඳින්වේ.

භාණ්ඩයකට හෝ ද්‍රව්‍යයකට විසිතුරු මෙන්ම කලාත්මක බවක් ගෙනෙන සැලසුම් කාර්මික සැලසුම් ලෙස සරලව දැක්විය හැක. එනම්, කාර්මික සැලසුම් කිසියම් භාණ්ඩයකට වඩාත් සිත් ගන්නා සුළු ආකර්ෂණිය පෙනුමක් ගෙන දෙයි. එමගින් ඒවායේ වාණිජ අගයද වැඩි කරයි. එමනිසා කාර්මික සැලසුම් ලියාපදිංචි කර ආරක්ෂා කරනු ලැබේ. කාර්මික සැලසුමක හිමිකරුවෙකුට ඒ සඳහා ඔහුට ඇති තනි අයිතිය තහවුරු වීම මඟින් නීත්‍යානුකූල නොවන පිටපත් කිරීම් හා අනුකරණය කිරීම් වළක්වාලනු ලැබේ.






මේ අනුව, කාර්මික ක්ෂේත්‍රයේ සැලසුම් බිහිවීම දිරිගැන්වෙන අතර, එතුලින් ආර්ථික සංවර්ධනයක් මෙන්ම සම්ප්‍රදායානුකූල චිත්‍ර හා කලාශිල්ප ආරක්ෂා කර ගැනීමටද හැකිවේ. ඊට අමතරව නව නිර්මාණාත්මක සහ සෞන්දර්යාත්මක ආකර්ෂණීය නිර්මාණ බිහිවීම වර්ධනය වීම මගින් විශාල පරාසයක් තුල පාරිභෝගිකයාගේ සිතැඟි වලට අනුකූලව භාණ්ඩ තෝරා ගැනීමට හැකියාවක්ද ලැබේ.

කාර්මික සැලසුම් මගින් කෙරෙන කාර්යය බොහෝදුරට වෙළඳ ලකුණු වලින් කෙරෙන කාර්යයට සමාන වේ. යම්කිසි හැඩයක් හෝ පෙනුමක් මගින් නිෂ්පාදනයක් පහසුවෙන් වෙන්කර හඳුනා ගැනීමට හැකි වන බැවින් කාර්මික සැලසුම් එම භාණ්ඩයේ මුල්‍යමය අගය ඉහළ දැමීමට දායක වේ. අද අප භාවිතා කරන භාණ්ඩවල කාර්යක්ෂමතාවත්, ආකර්ෂණීය බවත් කාර්මික සැලසුම් මගින් වඩා ඔප්නැංවී ඇති අතර, නිරතුරුවම වෙනස්වන අපේ අවශ්‍යතා සමග ද, කාර්මික සැලසුම් වඩාත් හොඳින් සංයෝජනය වේ. අප භාවිතා කරන සපත්තුවල සිට පරිගණක යන්ත්‍ර දක්වාම මෙය සත්‍ය වන කරුණකි.

# වෙළඳ ලකුණු

වෙළඳ ලකුණු නැතහොත් **"Trade Marks"** ද කාර්මික දේපළ යටතේ එන තවත් බුද්ධිමය දේපළ වර්ගයකි.

එක් එක් භාණ්ඩ හා සේවාවන් පැහැදිලි ලෙස එකිනෙකින් වෙන්කර හඳුනාගත හැකි ලකුණු වෙළඳ ලකුණු ලෙස හැඳින්විය හැක. වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීමෙන් අනතුරුව එහි හිමිකරුට ඒ සඳහා තනි අයිතිය සහතික කෙරෙන අතර, විවිධ භාණ්ඩ හා සේවා තම භාණ්ඩ හෝ සේවාවන්ගෙන් පැහැදිලිව වෙන් කර දැක්වීමට එම ලකුණු ඔහුට හෝ ඇයට භාවිතා කළ හැක. එසේ නැතිනම් එම වෙළඳ ලකුණ වෙන අයෙකුට භාවිතා කිරීම සඳහා බලය පැවරීමට ද ඔහුට හෝ ඇයට හැකි වේ. වෙළඳ ලකුණු සඳහා ආරක්ෂාව ලැබෙනුයේ ශ්‍රී ලාංකික නීතියට අනුව වසර 10කට වුවද, එම කාලය වසර 10ක කාලපරිච්ඡේද වශයෙන් යළි යළිත් අලුත් කළ හැක. පාරිභෝගිකයින් තම සිත් ගත් යම් යම් නිෂ්පාදන හා බැඳී ඇති වෙළඳ ලකුණු කෙරෙහි වඩාත් සමීප වන බැවින් වෙළඳ ලකුණු වලට ඒ හා බැඳී ඇති ගෞරවනීය නාමය හා කීර්තිය ඉතා වැදගත් වේ.



පාරිභෝගිකයා විසින් උසස් ලෙස පිළිගැනුනු භාණ්ඩයක වෙළඳ ලකුණ ඔහු වෙත වඩාත් සමීප වන අතර, ඒ හේතුවෙන් නිෂ්පාදනයේ සම්පූර්ණ අගය ඉහළ යෑමක්ද සිදුවේ. එමෙන්ම එම වෙළඳ ලකුණ දරණ අනෙකුත් නිෂ්පාදන වල අගයද එම නිසාම ඉහළ යනු ඇත. ඒ අනුව යම් කීර්තිනාමයක් උසුලන වෙළඳ ලකුණක් යොදා ගැනීම මගින් යම් භාණ්ඩයක් සඳහා කිසියම් ප්‍රතිරූපයක් නිර්මාණය කළ හැකිසේම එතුලින් එම භාණ්ඩයට කිසියම් තත්වයක් එක් කළ හැක.




අද වෙළඳ ලකුණු හිමියන්ට එල්ලවන ප්‍රධාන තර්ජනය වනුයේ ව්‍යාජ අනුකරණයන්ය. කූට ව්‍යාපාරිකයින් විසින් ලියාපදිංචි වෙළඳ ලකුණු නීත්‍යානුකූල නොවන අයුරින් පිටපත් කර ව්‍යාජ අනුකරණයන් පිළිගත් වෙළඳ ලකුණු යටතේ අලෙවි කරනු ලැබේ. එසේ වුවද, එම ව්‍යාජ අනුකරණ වල මුල් භාණ්ඩය සතු ගුණාත්මක බව හෝ කලාත්මක බව දැකිය නොහැක.

# නිරතුරුවම ඔබ සමඟ රැඳී ඇති බුද්ධිමය දේපළ සඳහා උදාහරණ

ඔබ දිනපතා අතේ පළඳින මෙවැනි ඔරලෝසුවක් දෙස හොඳින් බලන්න. මෙය බිහිකිරීමෙහිලා දායකවූයේ, මිනිස් නිර්මාණාත්මක සිතුවිලි සහ නවතම යමක් බිහිකිරීමට හැකියාව ඇති මිනිසාගේ බුද්ධියයි. ඔරලෝසුවේ අංක නිරූපණය වීම **(digital display)** එහි ගාංචුව සහ මුහුණත පේටන්ට් බලපත්‍ර  යටතටත් , එහි මුහුණතේ පෙනුම හා පටිය කාර්මික සැලසුම් යටතටත් අයත්වන අතර, මුහුණතේ දැකිය හැකි නිෂ්පාදිත සමාගම සහ වෙළඳ ලකුණ ද ඇතුලුව මෙම ඔරලෝසුව බුද්ධිමය දේපළ ගණනාවකම සංකලනයක් බව දැන් ඔබට පැහැදිලි වනවා ඇති.






ඔබ දෙපයේ පළඳින සෙරෙප්පු කුට්ටමේ සුවපහසු බව සහ බර දරාගත හැකි සේ සකස් කළ නිර්මාණය පේටන්ට් මගින් ආරක්ෂා වී ඇති සේම, එහි පටිවල නිමාව සහ පතුලේ හැඩය යනාදිය එහි කාර්මික සැලසුම් වේ. එය නිපදවූ සමාගමේ වෙළඳ ලකුණ එහි කොතැනක හෝ සඳහන් වන අතර, මෙම සෙරෙප්පු කුට්ටමේද බුද්ධිමය දේපළ ගණනාවක්ම සංයෝග වී ඇති අයුරු දැන් ඔබට පැහැදිලි වනවා ඇති.



ඔබ වඩාත් ප්‍රියකරන ඔබේ දිග කලිසම පවා බුද්ධිමය දේපළ වල ප්‍රතිඵලයක් බව කවදා හෝ ඔබට හැඟුනිද? කෙසේ වෙතත්, සෑම දිග කලිසමක් සතුවම පේටන්ට් බලපත්‍ර කාර්මික සැලසුම් හා වෙළඳ ලකුණු බැඳී ඇත. එහි සිපරය පේටන්ට් බලපත්‍රයකින් ආරක්ෂිත වන අතර, එය සතු විශේෂ මැහුම් ක්‍රම කාර්මික සැලැසුමක කොටස් වේ. අවසාන වශයෙන් සෑම කලිසමක් සතුවම එය නිපද වූ සමාගමේ වෙළඳ ලකුණ අඩුම තරමින් එහි එක් තැනක හෝ තැන් කීපයක හෝ තිබිය හැක.

කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීමේ වැදගත්කම වඩාත් මතුකර පෙන්වීම සඳහා සරල අවිකණ්ණාඩිය උදාහරණයක් ලෙස දක්වමු. බොහෝවිට අවිකණ්ණාඩියේ රාමුව නිපද වූ ක්‍රමයටත්, එහි කාච පැහැගැන් වූ ක්‍රමයටත් වඩා වැදගත් වනුයේ, කාච වල හැඩයට සහ එහි රාමුව අලංකරණය කිරීමට යොදාගත් කාර්මික සැලසුමයි. බොහෝ අවිකණ්ණාඩිවල වෙළඳ ලකුණ දිස්වනුයේ ඉතා කුඩාවට බැවින්, අවිකණ්ණාඩි සඳහා වැඩි වටිනාකමක් ලබා දෙනුයේ එයට සම්පූර්ණ සුන්දරත්වය ලබා දුන් කාර්මික සැලසුමය.

අප දිනපතා භාවිතා කරන ජංගම දුරකථනයද එවැනිම තවත් උදාහරණයකි. ජංගම දුරකථනයක ප්‍රමාණයත්, හැඩයත්, වර්ණයත් එහි සම්පූර්ණ පෙනුමත් පාරිභෝගිකයාගේ සිත් ඇද ගැනීමට මෙන්ම එහි ක්‍රියාකාරිත්වයටද බොහෝ සේ බලපානු ඇත. ජංගම දුරකථනයක් සතු පෙනුම එයට ලැබී ඇත්තේ එහි කාර්මික සැලසුම මගිනි.



ඔබ රැගෙන යන ඔබේ අත් බෑගය හෝ ගමන්මල්ල ද තවත් මෙවැනිම උදාහරණයකි. මෙයද ඉහත සඳහන් කළ බුද්ධිමය දේපළ වර්ග කිහිපයකම එකතුවකි. එහි නිෂ්පාදිත සමාගමේ වෙළඳ ලකුණ ද, කාර්මික සැලසුම් ද වේ. මේ අතරට එහි පෙනුම, හැඩය හා වර්ණ අයත් වේ. එසේම පේටන්ට් බලපත්‍ර වලින් ආරක්ෂිත නව නිපැයුම් වන ගාංචු සහ වතුර කාන්දු නොවීමේ ලක්ෂණ ආදිය ද ඇතුලත් වේ.

සෑම සංයුක්ත තැටි වාදකයක්ම ද **(CD player)** බුද්ධිමය දේපළ ගණනාවකම සංකලනයකි. එහි වෙළඳ ලකුණ, පේටන්ට් බලපත්‍ර වලින් ආරක්ෂිත නිර්මාණ වන පටිගත කිරීමේ හැකියාව සහ නැවත වාදනය කිරීමේ හැකියාව, එමෙන්ම එහි සුන්දරාත්මක හැඩය සහ පෙනුම මෙන්ම පිටත කවරයද ආරක්ෂිත බුද්ධිමය දේපළ වේ.



# භූගෝලීය දර්ශක


කාර්මික දේපළ යටතේ ගැනෙන තවත් බුද්ධිමය දේපළ වර්ගයක් අවසාන වශයෙන් අපි ඔබට දැන් හඳුන්වා දෙමු. ඒ භූගෝලීය දර්ශකයි. ඉංග්‍රීසි භාෂාවෙන් මෙය **"Geographical Indications"** ලෙස හඳුන්වයි.

භූගෝලීය දර්ශක යොදා ගනු ලබන්නේ යම්කිසි භූගෝලීය ප්‍රදේශයක එනම් ගමක, නගරයක, පළාතක හෝ රටක සම්භවය ලැබූ, සමීපව හඳුනාගත හැකි ලක්ෂණ සහිත, විශේෂිත නිෂ්පාදනයන් සඳහාය. මෙවැනි භූගෝලීය ප්‍රදේශයක් හා සබැඳි නිෂ්පාදන බොහෝවිට වටිනා කීර්ති නාමයන් අත්කර ගනු ලබන්නේ ඒවා සතු ගුණාත්මක බව හෝ ආවේණික ලක්ෂණ හේතුවෙනි. එම නිසා එම නිෂ්පාදන විවිධ ජාතික නීති මගින් ආරක්ෂා කරනු ලැබේ. උදාහරණ ලෙස ප්‍රංශයේ ෂැම්පේන් පළාතේ නිපදවන ස්පාක්ලන් වයින් **(sparkling wine)** "ෂැම්පේන්" නමින්ම හැඳින්වෙන අතර වෙනත් ප්‍රදේශ වල නිෂ්පාදිත ස්පාක්ලින් වයින් සඳහා "ෂැම්පේන්" නම භාවිතා කිරීම නීත්‍යානුකූල නොවේ.

භූගෝලීය දර්ශක යනු කුමක්දැයි පැහැදිලි කිරීම සඳහා තවත් හොඳ උදාහරණයක් වනුයේ ස්විස් චොකලට්ස් සහ ස්විස් ඔරලෝසුය. ස්විට්සර්ලන්තයේ නිෂ්පාදිත චොකලට් වල රසය හා ගුණාත්මක බව එම රටට සුවිශේෂවූත් ලාක්ෂණවූත්, තත්ත්වයන්ගෙන් සමන්විත වේ. එම රටෙහි නිෂ්පාදිත ස්විස් ඔරලෝසුද ගුණාත්මක බවින් මෙවැනිම කීර්තියක් උසුලයි.




ටොබ්ලරෝන් යන වෙළඳ ලකුණින් ආරක්ෂිත ස්විස් චොක්ලට්







ප්‍රංශයේ ෂැම්පේන් පළාතේ නිපදවන ස්පාක්ලිං වයින්

ග්‍රීසියේ නිෂ්පාදනය කරනු ලබන එම රටටම ආවේනික වූ **“feta”** චීස් ද, කියුබාවේ හවානා ප්‍රදේශයේ වවන දුම්කොළ සඳහා **“Habana”** යන නාමයද භූගෝලීය දර්ශක සඳහා දිය හැකි එවැනිම උදාහරණ වේ.




*Feta cheese*

මෙක්සිකෝවේ නගරයක් වන **“Tequlia”** වේ නිෂ්පාදනය කරනු ලබන **“Tequlia”** නමැති මධ්‍යසාර පානයද එයටම විශේෂ වූ ගුණාත්මක ලක්ෂණ රැසකින් සමන්විත වේ. මෙම **“Tequlia”** පානය 1977 වර්ෂයේ සිටම මෙක්සිකානු රජය විසින් භූගෝලීය දර්ශකයක් ලෙස ආරක්ෂා කරනු ලබන නිෂ්පාදනයකි. මේ අනුව, **“Tequlia”** යන නාමය මෙම විශේෂිත වූ මධ්‍යසාර පානය සඳහා භාවිතා කළ හැකි වන්නේ ඒ සඳහා විශේෂ වූ අවසරය ඇති මෙක්සිකෝවේ ප්‍රාන්ත 4කට පමණි. නිල් පැහැති අගාවේ ශාක සාරයෙන් මෙම පානය නිෂ්පාදනය කරනු ලබයි.



*Tequlia*

# ලෝක බුද්ධිමය දේපළ සංවිධානය

1970 වසරේ ස්ථාපිත කරන ලද ලෝක බුද්ධිමය දේපළ සංවිධානය, බුද්ධිමය දේපළ සුරැකීම සඳහාම කැපවූ ජාත්‍යන්තර සංවිධානයකි. මෙම සංවිධානය ලොව පුරා විසිරී සිටින නිර්මාණකරුවන්ගේ සහ නව නිපැයුම්කරුවන්ගේ බුද්ධිමය දේපළ වල අයිතීන් තහවුරු කිරීමටත්, ඔවුන් හඳුනාගෙන ඔවුන්ගේ නිර්මාණ සහ නව නිපැයුම් කුසලතා ඇගයීම, දිරිමත් කිරීමටත් උදව් කරයි. 2019 දී ලෝක බුද්ධිමය දේපළ සංවිධානයට අයත් සාමාජික රටවල් 192කි.(**WIPO** වෙබ් අඩවිය) මෙම සංවිධානය එම රටවල් සමග මිනිසාගේ සමෘද්ධිය හා සෞභාග්‍ය උදෙසා ඉතා සමීපව කටයුතු කරයි.

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය හා බැඳී පවතින බුද්ධිමය දේපළ සුරැකීම පිළිබඳ ගිවිසුම් රාශියකි. මෙම සංවිධානය විවිධ රටවල් හා බැඳී ඇති බුද්ධිමය දේපළ පිළිබඳ නීති හා රෙගුලාසි මෙම ගිවිසුම් මාර්ගයෙන් අනුග්‍රහ කිරීම සඳහා උදව් කරයි. තවද, බුද්ධිමය දේපළ සුරැකීම හා එය පුළුල් කිරීම සඳහා එම දේපළ ලියාපදිංචි කිරීමට ස්ථාවර ගෝලීය ව්‍යුහයක් ස්ථාපිත කිරීමටද මෙම සංවිධානය කටයුතු කරයි.

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය තම මුදලින් පවත්වා ගෙන යන ආයතනයක් වන අතර, එය 90% කට වැඩි ප්‍රතිශතයක් මුදල් උපයා ගන්නේ බුද්ධිමය දේපළ ලියාපදිංචි කිරීමේ සේවාවන් වලිනි. ඉතිරි මුදල සාමාජික රටවල් මගින් ගෙවන සාමාජික මුදල් වලින් උපයා ගනියි.



# ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

ශ්‍රී ලංකාවේ වත්මන් බුද්ධිමය දේපළ පද්ධතිය පාලනය කරනු ලබන්නේ විවිධ ආකාරයේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ ඒවායේ උපාර්ජනය කළමනාකරණය සහ බලාත්මක කිරීම සඳහා විධිවිධාන සලස්වා ඇති 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මගිනි. මේ අනුව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පද්ධතිය පරිපාලනය කිරීමේ පූර්ණ බලතල පැවරී ඇත.

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පරිපාලනය සඳහා වගකිව යුතු එකම රජයේ ආයතනය වනුයේ මෙම නීතිය යටතේ ස්ථාපිත කර ඇති ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයයි. එම බලය පැවරීම සහිතව 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ සංග්‍රහ පනතේ විධිවිධාන යටතේ එය පළමුව ස්ථාපිත කරනු ලැබුයේ 1982 ජනවාරි 1 වන දිනයේදීය.

ඔබගේ සියලුම බුද්ධිමය දේපළ අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වෙබ් අඩවියට පිවිසෙන්න.

*https://www.nipo.gov.lk/*



මෙම පොත් පිංච මගින් බුද්ධිමය දේපළ විවිධාකාරයෙන් ඔබේ එදිනෙදා ජීවිතය කෙරෙහි බලපාන ආකාරය ගැන පැහැදිලි කිරීමට අපි උත්සාහ කළෙමු. බුද්ධිමය දේපළ ඔබටත්, ඔබේ ලෝකයටත්, කෙතරම් වැදගත් දැයි සිතන්න. ඒවා නොමැති වූයේ නම් ලෝකය මේ තරම් සුන්දර ස්ථානයක් නොවනු ඇත.

එම නිසා අපි සැවොම එකට එකතු වී නිර්මාණකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කළ යුතුයි. නිර්මාණාත්මක බව ලොව සතු වටිනාම ස්වාභාවික සම්පතයි. එය අප විනාශ නොකළ යුතුයි. මතුවට ඔබට සිතුනොත් අන්තර්ජාලය හරහා මුදල් නොගෙවා ගීතයක් ලබා ගැනීමට, හෝ අනුකරණය කරන ලද දිගු කලිසමක් මිලදී ගැනීමට, ඔබ වඩාත් කැමැති රසවින්දනය ඔබ වෙත ගෙන ඒමට වෙහෙස වී වැඩ කළ එම කලාකරුවාගේ හිමිකම් ගැන මොහොතක් සිතන්න. ඔබ වඩාත් කැමැති ඇඳුම් නිර්මාණය කල නිර්මාණ ශිල්පියාගේ හිමිකම් ගැන මොහොතක් සිතන්න. ඔබ ආදරය කරන බොහෝ දේ නිර්මාණය කරන එම ශිල්පීන් නොසිටියා නම් මේ ලෝකය මොනවගේ තැනක් වෙයි කියලද ඔබ හිතන්නෙ?




ව් බුද්ධිමය දේපළ වලින් සපිරි ඔබේ ලෝකයයි !

# සිතීමට,
# සිතින් මැවීමට,
# නිර්මාණය කිරීමට
# පසුබිමක් !

**WIPO** ප්‍රකාශනයක් ඇසුරිනි.

නොමිලයේ බෙදාහැරීම පිණිසයි.

ISBN 978-955-590-135-2

වැඩි විස්තර සඳහා,

**ජාතික විද්‍යා පදනම**
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 07.

දුරකථන : +94 112694170
+94 112696771 - 3

ෆැක්ස් : +94 112694754

ඊ - මේල් : dg@nsf.gov.lk
info@nsf.gov.lk

වෙබ් අඩවිය : www.nsf.gov.lk

: https://www.facebook.com/nsflk/

: https://twitter.com/NSFSriLanka

: https://www.youtube.com/user/NSFSL